සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| තෙවන වාර පරීක්ෂණය 2017 | 10 ශ්‍රේණිය |
| மூன்றாம் தவணைப் பரீட்சை 2017 | தரம் 10 |
| **Third Team Test 2017** | **Grade 10** |

| | | |
|---|---|---|
| බුද්ධ ධර්මය I | | පැය එකයි |
| **Buddhist I** | | **One hours** |

**නම/විභාග අංකය : ....................................................................**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

1. බෝසතාණෝ තමාගේ අවසන් උපත සඳහා නුවණින් විමසා බැලීම.
   1. පංචමහා විලෝකනයයි  2. ප්‍රත්‍යාවේක්ෂාවයි
   3. පංචනීවරණයි  4. පංච අභිඥාවයි

2. සිදුහත් කුමරු විවාහ වූයේ භද්දච්චායනා හෙවත් යසෝදරා කුමරිය සමගය. යසෝදරා දේවියගේ සහෝදරයා වූයේ,
   1. නන්ද කුමරුය  2. දේවදත්ත කුමරුය
   3. අනුරුද්ධ කුමරුය  4. ආනන්ද කුමරුය

3. පස්වග තවුසන් උදෙසා දේශනා කරන ලද සූත්‍රය වන්නේ,
   1. සිඟාලෝවාද සූත්‍රය  2. රතන සූත්‍රය
   3. දම්සක් පැවතුම් සූත්‍රය  4. කරණීයමෙත්ත සූත්‍රය

4. සංඝරත්නය ගුණ ගණන,
   1. 9 කි  2. 6 කි  3. 8 කි  4. 5 කි

5. බෞද්ධයෙකු වීමේ පළමු පියවර වන්නේ,
   1. ශ්‍රද්ධාවෙන් කටයුතු කිරීමයි  2. තෙරුවන් සරණ යාමයි
   3. බුදුන් සරණයාමයි  4. දහම් සරණ යාමයි

6. තෙරුවන් ගුණ හැඳින්වෙන තවත් නමකි,
   1. සිව්සස්ය  2. නව අරහාදී බුදුගුණය
   3. සුවිසි ගුණ  4. දහම් ගුණය

7. මනා පිළිවෙත් රකින හෙයින් සඟරුවන,

1. උජුපටිපන්න වෙයි
2. ඤායපටිපන්න වෙයි
3. සුපටිපටිපන්න වෙයි
4. සාමීචිපටිපන්නවෙයි

8. උද්දච්ච කුක්කුච්ච යනු,

1. සිතේ පවත්නා නොසන්සුන්කමයි
2. තරහ ස්වභාවයයි
3. සිතිවිලිවල උදාසීන කමයි
4. පංච ඉන්ද්‍රියයන් පිනවීමට ඇති කැමැත්ත යි

9. සිත කිළිටි කරන, කුසල් සිත් වලට බාධා කරන සිතිවිලි හඳුන්වන නම,

1. කාමච්ඡන්දයයි
2. උද්දච්ඡයයි
3. නීවරණයයි
4. ථීනමිද්දයයි

10. සමථ භාවනාව වැඩීමෙන් උපදවා ගත හැක්කේ,

1. සප්ත සමාපත්තියයි
2. පංච අභිඥා අෂ්ට සමාපත්තියයි
3. කිසිවක් නොවැඩේ
4. සියළු කෙලෙස් නැතිවී යයි

11. ලෝක සත්වයා යැයි කියනු ලබන ස්කන්ධ ධර්මයන්ගේ යථාර්ථය ත්‍රිලක්‍ෂණයෙන් අවබෝධවෙයි. ත්‍රිලක්‍ෂණය යනු,

1. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම
2. ශීල, සමාධි, ප්‍රඥාවයි
3. රාග, දෝෂ, මෝහය
4. දාන, ශීල, භාවනාවයි

12. ශ්‍යාමෝපාලි වංශික මහා නිකාය හෙවත් සියම් මහ නිකාය මෙරට ආරම්භ වීමට හේතු වූ උපසම්පදා විනය කර්මය සිදු වූයේ ව්‍යවහාර වර්ෂ ප්‍රමාණයෙන් කවර වසරේදීද?

1. 1653 දීය
2. 1753 දීය
3. 1853 දීය
4. 1835 දීය

13. විදේශීය ආක්‍රමණිකයන්ගෙන් රට ජාතිය බේරා ගෙන බුදු සසුන නොයෙක් අයුරින් නගා සිට වූ ශ්‍රේෂ්ඨ පාලකයෙකි.

1. දුටුගැමුණු රජතුමා
2. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා
3. මහසෙන් රජතුමා
4. විජය රජතුමා

14. පුද්ගලයාගේ යසස වැඩීම සඳහා අගනා උපදේශයන් ලබා දෙන ධම්මපද ගාථාව වන්නේ,

1. උට්ඨානවතෝ සතිමතෝ
2. නහීවේරේන වේරානි
3. අචරිත්වා බ්‍රහ්ම චරියං
4. සබ්බපාපස්ස අකරණං

15. බුදු දහමට අනුව අප විසින් කළයුතුදේ නොකළයුතුදේ හඳුන්වන නම කුමක්ද?

1. වැඩ හා අවැඩ නමිනි
2. ගුණ හා අගුණ නමිනි
3. සිරිත් හා විරිත් නමිනි
4. පින් පව් නමිනි

16. බුද්ධ කාලයේ සිටි මහ ධන සිටු පුත්‍රයාට පරම්පරාවෙන් උරුම වූ සියළුම වස්තුව ඇඳිවතට පමණක් සීමා වන ලෙස පිරිහී ගියේ කුමන හේතුවෙන්ද?

1. කම්මැලිකමින් සිටි නිසා
2. ශීලයේ නොපිහිටි නිසා
3. උත්සහය අත්හැරි නිසා
4. ධර්මය නොතැකූ නිසා

17. ඌරන් ඝාතනය කිරීම තම ජීවන වෘත්තීය බවට පත්කර ගෙන තිබූ නිසා මරණාසන්න අවස්ථාවේදී ඌරකු මෙන් වේදනාවෙන් කෑගසමින් සිට මරණයට පත් වූ බව සඳහන් වන්නේ මින් කවුද?

1. චුන්ද සූකර
2. චුන්ද කර්මාර පුත්‍රයා
3. චූල්ල ධනුද්ධර
4. චූල්ල පන්ථක

18. මිනිස් සමාජයේ වඩාත් ප්‍රියශීලි සුහද සම්බන්ධයන් අන්‍යෝන්‍ය වශයෙන් පවත්වාගෙන යාම පිණිස උපදෙස් ලබාදෙමින් දේශිත සූත්‍ර දේශනාව මේ අතරින් කුමක්ද?

1. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය
2. රතන සූත්‍රය
3. චූල්ලහත්ථිපදෝපම සූත්‍රය
4. සිඟාලෝවාද සූත්‍රය

19. බ්‍රහ්මයන් තුළ පවත්නාවූ සතර බ්‍රහ්ම විහරණ දෙමව්පියන් තුලද පවතින බව බුදු දහමේ දැක්වෙයි. එබැවින් දෙමව්පියන් හැඳින්වීමට යෙදිය හැකි නාමයන් වන්නේ මින් කුමක්ද?

1. ආර්ය
2. උත්තම
3. ශ්‍රේෂ්ඨ
4. බ්‍රහ්ම

20. ශිෂ්‍ය ප්‍රජාවගේ පුද සත්කාර ලැබීමට සුදුසුවන හෙයින් ගුරුවරුන් සිඟාලෝවාද සූත්‍රයේදී සමානකර දක්වා ඇත්තේ කිනම් දිසාවකටද?

1. දකුණු දිසාව
2. උතුරු දිසාව
3. බටහිර දිසාව
4. නැගෙනහිර දිසාව

21. අප සැම ජීවත්වන ලෝකයේ ස්වභාවය ලෙසින් බුදු දහමේ දැක්වෙන්නේ කුමක්ද?

1. පටිසෝතගාමී
2. පුරෝගාමී
3. අනුසෝතගාමී
4. පසුගාමී

22. රාගා දී කෙලෙස් මළවලින් දූෂිතව සිටින මිනිස් සමාජයේ උපත ලැබුවද කෙලෙස් මළවල නොගිලී සිටි බුදුරජාණන් වහන්සේ ගතකළ දිවිය උපමා කර ඇත්තේ කවර පුෂ්පයකටද?

1. නිල් උපුල් මලකට
2. පියුමකට
3. ඕලු මලකට
4. නා මලකට

23. සතර සංග්‍රහවස්තු අතර අනුන්ගේ දියුණුවට උදවු කිරීම යනුවෙන් හැඳින්වෙන්නේ,

1. දානයයි
2. ප්‍රියවචනයයි
3. අර්ථචර්යාවයි
4. සමානාත්මතාවයයි

24. රටක් තුළ විවිධ ජාතීන්ට කුලයන්ට, ගෝත්‍රයන්ට ආගම්වලට, අයත් ජනයා ජීවත් වෙයි. මේ සියලු ජනයා තම ජාතියට ආගමට අනන්‍යවූ සිරිත් විරිත් ඔස්සේ තම ජීවිතය සිතුම් පැතුම් අදහස් උදහස් සකසා ගනී. මෙයින් අදහස් කෙරෙන්නේ,

1. සහජීවනයයි
2. ජාතීන් අතර දියුණුවයි
3. ජාතීන් අතර බැඳීමයි
4. ජාතීන්ට ගරු කිරීමයි

25. මරණින් මතු පළමු ආත්මභවයේදී විපාක දෙන කර්මය වන්නේ,

1. දිට්ඨධම්මවේදනීය කර්මයයි
2. උප්පජ්ජවේදනීය කර්මයයි
3. අපරාපරියවේදනීය කර්මයයි
4. අහෝසි කර්මයයි

26. කිසියම් පුද්ගලයකු උපත ලනබ්නේ යස ඉසුරින් පිරුණු ස්ථානයක නම් පෙර භාවයන්හිදී සිදු කරන ලද අකුසල කර්මයන්හි විපාක දීම බොහෝ විට වැළකී යයි. මෙම අවස්ථාව වන්නේ,

1. උපධි සම්පත්තියයි
2. කාල සම්පත්තියයි
3. ප්‍රයෝග සම්පත්තියයි
4. ගති සම්පත්තියයි

27. බුදු දහමට අනුව හට ගැනිමේ ස්වභාවය ඇති සැමදේම නැතිවීමේ ස්වභාවයෙන් යුක්තවේ. සත්ත්ව, පුද්ගල, ද්‍රව්‍ය ආදී ඕනෑම ජීව අජීව පදාර්ථයකටම මෙම තත්ත්වය සහතික වූ පොදු ධර්මතාවකි. ඒ අනුව රූපය

1. දිය බුබුළක් වැනිය
2. පෙණපිඬක් වැනිය
3. කෙසෙල් කඳක් වැනිය
4. මිරිඟුවක් වැනිය

28. බුද්ධ දේශනාව අනුව ලොව යථාර්ථය ලෙසින් ගත්කල සංසාරික පැවැත්ම කෙබඳුද?.

1. සොම්නස් සහගතය
2. ප්‍රියජනකය
3. දුක් සහිතය
4. මධ්‍යස්ථ වේදනා සහිතය

29. පටිච්ච සමුප්පාද ධර්මතාවය වඩාත් නිවැරදි ලෙස හැඳින්විය හැකි තවත් පදයක් වන්නේ,

1. හේතුඵල දහමයි
2. අධිච්ච සමුප්පාද දහමයි
3. අහේතු අප්‍රත්‍යවාදය
4. ත්‍රිලක්ෂණයයි

30. බුදුවරයෙකු පහළ වන්නේ ලොව පවත්නා උත්තරීතර වූ පරම සත්‍යය මිනිසාට දේශනා කිරීමටය. එම පරම සත්‍යය නම් කුමක්ද?

1. පංචස්කන්ධයයි
2. ත්‍රිලක්ෂණයයි
3. දස කුසලයයි
4. චතුරාර්ය සත්‍යයි

31. සංසාරගත සියලුම දුක්වලට හේතුව වශයෙන් හඳුනාගත හැක්කේ,

1. ඉපදීමයි
2. තෘෂ්ණාවයි
3. අතෘප්තියයි
4. කුසලයයි

32. දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කරමින් ස්වාභාවික පරිසරය දම්සභා මණ්ඩපය බවට පත්කරගත් මුල්ම ස්ථානය වන්නේ මේ අතරින් කුමන ස්ථානයද?

1. ඉසිපතන මිගදායේදී
2. ගිජ්ජකූට පර්වතයේදීය
3. මකුල පර්වතයේදීය
4. භේෂකලා පර්වතයේදීය

33. ජීවක අඹවනයේදී බුදුරදුන් දේශනාකරන ලද සූත්‍ර දේශනාව කුමක්ද?

1. මහා මොග්ගල්ලාන සූත්‍රය
2. සාමඤ්ඤඵල සූත්‍රය
3. ගෝපාල සූත්‍රයේය
4. සෝණදණ්ඩ සූත්‍රයේය

34. බුදුරජාණන් වහන්සේ විසින් ගිරිමානන්ද ස්වාමීන් වහන්සේට දේශනා කරන ලද රෝග වැළදීමේ කරුණු ගණන කීයද?

1. හතකි
2. පහකි
3. නවයකි
4. අටකි

35. බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වන ආකාරයට අනුන්ගේ අත් උදව් නැතිව නැගිටින්නට බැරි තරමට අධිකව ආහාර ගන්නා තැනැත්තා හඳුන්වන නාමය,

1. ආහාර හත්ථක
2. අලංසාටක
3. කාකමාසක
4. භුත්ත වම්තක

36. ථේරවාදීන්ගේ සිව්වන ධර්ම සංගායනාව පවත්වන ලද්දේ කොහේදීද?

1. විශාලා මහනුවර වාලුකාරාමයේදී
2. මාතලේ අලු විහාර ආලෝක ලෙනේදීය
3. සප්තපර්ණී ගල්ගුහාවේදීය
4. පැළලුප් නුවර අශෝකාරාමයේදී

37. අනුරාධපුර යුගයට අයත් සඳකඩ පහණින් භව චක්‍රය අර්ථවත් කෙරෙන බව ප්‍රකාශ කළේ,

1. සී.පී. බෙල් මහතාය
2. ශිරාන් දැරණියගල මහතාය
3. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාය
4. මාර්ටින් වික්‍රමසිංහ මහතාය

38. හෙළයේ විශිෂ්ඨතම මහා කාව්‍යය වන "කව්සිළුමිණ"ට පාදක වී ඇති ජාතකය වන්නේ,

1. කුසජාතකයයි
2. උම්මග්ග ජාතකයයි
3. සස ජාතකයයි
4. වෙස්සන්තර ජාතකයයි

39. එක්තරා ප්‍රමාද කතාවක් වශයෙන් දීඝ නිකායේ චක්කවත්තී සීහනාද සූත්‍රයේ දැක්වෙන රාජ්‍ය පාලන ප්‍රතිපත්ති හැඳින්වෙන්නේ,

1. දස කුසල් ලෙසය
2. දස සක්විතිවත් ලෙසය
3. දස සංයෝජන ලෙසය
4. දස පුන්‍යක්‍රියා ලෙසය

40. බෞද්ධයකු වශයෙන් අප තෙරුවන් කෙරෙහි කරුණු දැන අවබෝධයන් යුතුව සරණ ගිය පිරිසක් විය යුතුය. මෙම පැහැදීම ධර්මයෙහි හැඳින්වෙන්නේ,

1. අමූලිකා ශ්‍රද්ධාවයි
2. අවෙච්චප්පසාදයයි
3. ආකාරවතී ශ්‍රද්ධාවයි
4. සල්ලේඛ ප්‍රතිපදාවයි

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| තෙවන වාර පරීක්ෂණය 2017 | 10 ශ්‍රේණිය |
| மூன்றாம் தவணைப் பரீட்சை 2017 | தரம் 10 |
| **Third Team Test 2017** | **Grade 10** |

| | | |
|---|---|---|
| බුද්ධ ධර්මය | **II** | පැය දෙකයි |
| **Buddhist** | **II** | **Two hours** |

- **පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය සඳහා 1 කොටසට 2 බැගින් ලකුණු 2x10 ලකුණු 20 ක් ද තෝරා ගත් ප්‍රශ්න 4ට පිළිතුරු සඳහා ලකුණු 10 බැගින් හිමිවේ.**

(01). i. "පංචශීලය" හඳුන්වන තවත් නම් දෙකක් ලියන්න.

ii. "රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං" යන්නෙහි අර්ථය ලියන්න.

iii. ශ්‍රද්ධාවේ ප්‍රභේද දෙක නම් කරන්න

iv. "සතිසම්පජඤ්ඤ" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

v. සිංහලයෙන් රචනා වූ පැරණිම ගී කාව්‍ය කෘති දෙකක් නම් කරන්න.

vi. ශ්‍රී ලංකාවේ දැකිය හැකි සඳකඩ පහණ අතරින් කලාත්මක බැවින් මුල්තැන ගත් සඳකඩ පහණ පිහිටියේ කොහිද?

vii. ත්‍රිලක්ෂණය නම් කරන්න.

viii. විපාක දෙන ආකාරය අනුව කර්මය සතර ආකාරවේ. ඉන් දෙකක් සඳහන් කරන්න.

ix. අනුරපුර යුගයේ නිර්මාණය කරන ලද සඳකඩ පහණෙහි දැකිය හැකි සත්ව රූප හතර නම් කරන්න.

x. බුදුන් වහන්සේ පස්වන වස්කාලය ගත කළේ කොහිද?

(02). i. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් ගුරු ශිෂ්‍ය සම්බන්ධය දක්වා ඇති දිසාව නම් කරන්න. (ලකුණු 02)

ii. ගුරුවරයා විසින් ශිෂ්‍යයා වෙනුවෙන් ඉටුකළයුතු යුතුකම් 05 කි. ඉන් තුනක් ලියන්න. (ලකුණු 03)

iii. ගුරු සිසු සබැඳියාව වර්ධනය කරගැනීමට දෙපාර්ශවයේම යුතුකම් මැනවින් ඉටුකළ යුතුය. විස්තර කරන්න. (ලකුණු 05)

(03). i. "උට්ඨානවතො සතිමතෝ" ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

ii. එම ගාථාවේ සිංහල තේරුම ලියන්න. (ලකුණු 03)

iii. පාසල් ශිෂ්‍යයෙක් වශයෙන් ඔබේ සාර්ථකත්වය සඳහා මෙම ගාථාවේ ඇතුළත් කරුණු ඉවහල්වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04). i. බුදුන් වහන්සේ ස්වාභාවික පරිසරය ආශ්‍රිතව වස් විසූ ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. බුදුන් වහන්සේ ස්වාභාවික පරිසරය දම්සභා මණ්ඩපය බවට පත්කරගත් අවස්ථා 03 ක් නම් කරන්න. (ලකුණු 03)

iii. පරිසරයට ආදරය කරන මිනිසුන් බිහිවිය යුතුය බුදු සිරිත උපමාවට ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05). i. තෙවන ධර්ම සංගායනාව පැවැත්වූයේ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වසර කීයකින්ද? කොහේදීද? (ලකුණු 02)

ii. මාතලේ අලුවිහාරයේ පැවති ත්‍රිපිටක ධර්ම සංගායනාවෙන් ලද ප්‍රතිඵල 03 ක් ලියන්න. (ලකුණු 03)

iii. ථේරවාදී සංගායනා හතර හා කණිෂ්ක සංගීතිය, ශාසන චිරස්ථිතියට හා ව්‍යාප්තියට උපකාරී වූ ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

(06). i. සතර සංග්‍රහ වස්තු නම් කරන්න. (ලකුණු 02)

ii. සමස්තයක් වශයෙන් දසසක්විතිවත් අනුගමනය කරන බෞද්ධ රාජ්‍ය පාලනයකින් අපේක්ෂිත කරුණු 03 ලියන්න. (ලකුණු 03)

iii. යහපත් පවුල් පරිසරයක් තුළ සමකාමී සහජීවන වටපිටාවක් ගොඩනගා ගැනීමට සප්ත අපරිහානීය ධර්ම ඇසුරින් ලැබෙනුයේ මනා පිටුබලයකි. පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07). පහත සඳහන් මාතෘකා ඇසුරින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. කනිෂ්ක ධර්ම සංගායනාව (ලකුණු 02)

ii. සරණංකර සංඝරාජ මා හිමි (ලකුණු 03)

iii. ගුරුසිසු සබඳතාව (ලකුණු 05)

iv. අනුරාධපුර හා පොළොන්නරු චිත්‍ර (ලකුණු 05)